# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2338/29 - 2023 ජූනි මස 27 වැනි අඟහරුවාදා - 2023.06.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 4/81 (XIII)

**1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත**

23ද (1)(අ) වන වගන්තිය යටතේ වූ නියමය

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23ද (1)(අ) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, පරිසර අමාත්‍ය, නසීර් අහමඩ් වන මා විසින්, මේ නියමය මගින්, 2021 ජනවාරි මස 21 වන දිනැති හා අංක 2211/51 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* එකී වගන්තිය යටතේ පළ කරන ලද නියමය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(අ) එහි (ආ) ඡේදයේ (i) වන අනුඡේදය ඉවත් කර, ඒ වෙනුවට, පහත කොටස ආදේශ කිරීමෙන් :-

''(i) අන්තර්ගත ශුද්ධ පරිමාව මි. ලී. 20 ට/ශුද්ධ බර ග්‍රෑම් 20 ට වඩා අඩු හෝ ඊට සමාන සැෂේ පැකට් (sachet) (ආහාර, ඖෂධ සහ පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා විසින් අනුමත කරන ලද කෘෂි රසායන ඇසුරුම් කිරීමට හැර) ;''

(ආ) එහි ''ක්‍රියාවලිය'' යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :-

''පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා'' යන්නෙන්, 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 3 වන වගන්තිය යටතේ පත් කරන ලද පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා අදහස් වේ ;''.

නසීර් අහමඩ්,
පරිසර අමාත්‍ය.

2023 ජූනි මස 21 වැනි දින,
කොළඹ දී ය.

EOG 06 - 0227

1A - PG 6371 — 1006 (2023/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*